# නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී

## ඔබ දැනගත යුතු පියවර දහයක්

අමාලි
ලියනගේ
(බදු හා ව්‍යාපාර
උපදේශක)



ඔබ ඔබගේම කියා ව්‍යාපාරයක් ඇරඹීමට සිතනවාද ? එසේ නම් ඔබ දැනුවත් විය යුතු මූලික කරුණු කීපයක් මෙම ලිපිය තුලින් සාකච්ඡාවට බඳුන් කෙරේ.

**1 පලමු පියවර :** ව්‍යාපාරය පිලිබඳ මූලික සැලැස්මක් (Business Plan) සකස් කර ගැනීම.

මූලික ව්‍යාපාරික සැලැස්මක් සඳහා සුවිශේෂ ක්‍රමයක් නොමැති අතර එය ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වෙනස් වේ. නමුත් එම මූලික සැලැස්ම පහත කරුණු වලින් සකසා ගත හැකි ය.

- ප්‍රධාන හා මූලික ව්‍යාපාරික කටයුතු
- එම ව්‍යාපාරික කරුණු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය
- අලෙවිකරණය හා තරගකාත්වයට මුහුණ දීම
- ව්‍යාපාරයට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ලබාගත හැකි මාර්ග
- අපේක්ෂා කරන ලාභ අලාභයන්, මුදල් ප්‍රවාහයන් පිලිබඳ ඇස්තමේන්තු

මෙම ව්‍යාපාරික සැලැස්ම ඔබගේ ව්‍යාපාරයේ ඉදිරි වැඩකටයුතු සැලසුම් කිරීමට ප්‍රයෝජනවත් වනවා සේම බැංකු මුදලක් ලබාගැනීම වැනි කටයුත්තකදී ඉතා ප්‍රයෝජනවත් වේ.

**2 දෙවන පියවර :** ව්‍යාපාරයේ පවත්වාගෙන යාමේ නිත්‍යානුකූල ස්වරූපය (Legal Stucture ) තීරණය කිරීම

ඔබ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී එම ව්‍යාපාරය විවිධාකාරී වු නිත්‍යානුකූල ස්වරූපයන්ගෙන් ආරම්භ කල හැකි ය. එනම්,

**A) තනි ව්‍යාපාරයක් ලෙස (Sole Trader)**

ඔබගේ ව්‍යාපාරය ඔබගේ තනි අයිතියක් ලෙස පවත්වා ගැනීමට කැමතිනම් එවිට එය තනි ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යා හැක. මෙහිදී ඔබට තනි තීරණ ගැනීමේ හැකියාව පවතින අතර සියළුම ලාභ අලාභයන් සේම වගකීම්ද තනිව දැරීමට සිදුවේ. විශේෂ නිපුනතා ඇති පුද්ගලයන් (Professional) බොහෝ දුරට තනි ව්‍යාපාර ලෙස ලියාපදිංචි වීමට වැඩි ප්‍රවනතාවක් දක්වයි.

**B) හවුල් ව්‍යාපාර ලෙස (Partnership)**

ඇතැම් ව්‍යාපාරිකයන් තම ව්‍යාපාර හවුල් ව්‍යාපාර ලෙස තවත් පුද්ගලයන් දෙදෙනෙක් හෝ වැඩි පිරිසක් සමග හවුලේ පවත්වාගෙන යයි. මෙහිදී සියළුම හවුල්කරුවන් හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුකූලව ව්‍යාපාරයේ වත්කම් වගකීම් හා ලාභ අලාභ සඳහා අයිතිවාසිකම් දරයි.

**C)භාරකාරත්වය ලෙස (Trust)**

මෙම ව්‍යාපාරික ස්වභාවය ඕස්ට්‍රේලියාවේ ඉතාමත් ප්‍රචලිත වන අතර මෙමගින් සිදුවන්නේ එම භාරකාරීත්වය එහි ප්‍රතිලාභ හිමිකරුවන් වෙනුවෙන් වත්කම් හා ආදයම් රැඳවාගෙන තබාගැනීමයි. ඔබ පවුල් ව්‍යාපාරයක් ඇරඹීමට සිතයි නම් මෙම ක්‍රමය වඩා ප්‍රචලිත හා සුදුසු ක්‍රමය වනු ඇත.

**D) සමාගමක් ලෙස (Company)**



සමාගමක් ලෙස ඔබ ව්‍යාපාරය ලියාපදිංචි කලහොත්, එවිට එම ව්‍යාපාරය නීතිය ඉදිරියේදී වෙනම ඒකකයක් ලෙස පිලිගනී. එනම් ඔබගේ ව්‍යාපාරයට එම ව්‍යාපාරය නමින් වත්කම් හා වගකීම් තබාගත හැකිවා සේම එම සමාගමට සමාගමේ කොටස්කරුවන්ගෙන් වෙන්වු නෛතික පැවිත්මක්ද පවතී.

මෙම විවිධ නෛතික ස්වරූපයන් ඔබගේ ව්‍යාපාරයේ බදු ගණනය කිරීම් සඳහාද විවිධාකාරී ලෙස බලපායි. උදහරණයක් ලෙස ඔබ තනි ව්‍යාපාරිකයෙක් නම් (Sole Trader) ඔබගේ ව්‍යාපාරය සඳහා බදුගෙවිය යුත්තේ තනි පුද්ගල බදු අනුපාත (Industrial Tax Rate) අනුව වන අතර සමාගමක් නම් (Company) බදු සමාගම් බදු අනුපාතය (Company Tax Rate) භාවිතා කල යුතුය.

**3 තෙවන පියවර :** ව්‍යාපාරික නාමය ලියාපදිංචි කරීම (Registration of Business Name)

ව්‍යාපාරික නාමය ඕනෑම ව්‍යාපාරයකට ඉතා වැදගත් ම අංගයකි. එය ඔබගේ ව්‍යාපාරය අනෙකුත් ව්‍යාපාරවලින් වෙන්ව හඳුනාගැනීමට සේම ඔබගේ තරඟකාරී ව්‍යාපාර වලින් ඔබව ඔබගේම සේවාදයකන් වෙත බැඳ තබාගැනීමටද ඉවහල් වනු ඇත.

2012 මැයි 28 වනද සිට සියළුම ව්‍යාපාර නාම ලියාපදිංචිය ඕස්ට්‍රේලියානු සුරැකුම්පත් හා විනිමය කොමිෂම (Australian Securities & Investment Commission - ASIC) හරහා සිදුකරනු ලබයි. මෙම වෙනසට පෙර සියළුම තනිව්‍යාපාර, හවුල ව්‍යාපාර හා භාරකාර අරමුදල් ලියාපදිංචි සිදුකරනු ලද්දේ එම අදල ප්‍රාන්ත තුලිනි.

**සිව්වන පියවර :** ඕස්ට්‍රේලියානු ව්‍යාපාරික අංකය සඳහා ලියාපදිංචි වීම (Registration for Australian Business Number - ABN)

ඕස්ට්‍රේලියන් ව්‍යාපාරික අංකය, අංක 11 කින් සැදුම්ලත් වන අතර එම අංකය ඔබ අනෙකුත් ව්‍යාපාර සමඟ ගනුදෙනු කිරීමේදී අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස ඔබගේ විකුණුම් ඉන්වොයිස් වල ABN අංකය සඳහන් කිරීම අවශ්‍ය වේ. එසේ නොවුනොත් අනෙකුත් ව්‍යාපාර ඔබට ගෙවීමේදී 46.5% රඳවාගෙන ඉතිරිය ගෙවනු ඇත. ඔවුන් එම 46.5% ඔබගේ බදු ගෙවීම් සඳහා භාවිතා කරනු ඇත.

ABN අංකය සඳහා ලියාපදිංචිය අනිවාර්ය කර නොමැති වුවත්, ඔබට භාණ්ඩ හා සේවා බද්ද (GST) ලියාපදිංචි වීමට ABN අත්‍යාවශ්‍ය වේ. කෙසේ වුවත් ්ඊහ තිබීම තුලින් ඔබට පහත වාසි සැලසේ.

■ ඔබගේ ව්‍යාපාරයටම අදාල Business Activity Statement එකක් ලබා ගත හැකි වීම.
■ භාණ්ඩ ඇණවුම් කිරීමේදී හා විකිණීමේදී ඔබගේ ව්‍යාපාරයේ අනන්‍යතාව අනෙකුත් පාර්ශවයන්ට තහවුරු කිරීම.
■ භාණ්ඩ හා සේවා බදු බැර කිරීම් (GST Credit) ලබාගැනීමට
■ බලශක්ති ප්‍රදනයන් (Energy Grant Credit) ලබාගැනීමට
■ ඩොමේන් නාමයක් (Domain Name) ලබාගැනීමට

**5 පස්වන පියවර :** බදු අංකයක් සඳහා ලියාපදිංචි වීම (Registration of Tax File Number - TFN)

ව්‍යාපාරයක් සඳහා නිකුත්කරන බදු අංකය ඒ ඒ ව්‍යාපාරය සඳහාම වු තනි (Unique) අංකයකි. බදු අංකයක් ලබාගැනීමට අත්‍යාවශ්‍ය වන්නේ හවුල් ව්‍යාපාර, භාරකාර අරමුදල් හෝ සමාගම් සඳහා පමණි. තනි ව්‍යාපාරිකයන්ට තමන්ගේ පුද්ගලික බදු අංකය තම ව්‍යාපාරය සඳහාද භාවිතා කල හැක.

**6 හයවන පියවර :** භාණ්ඩ හා සේවා බද්ද (GST) සඳහා ලියාපදිංචි වීම පහත ව්‍යාපාර සඳහා අනිවාර්ය වේ.

■ ඔබගේ ව්‍යාපාරයේ පිරිවැටුම (Turnover) වසරකට / 75,000 වඩා වැඩිනම්
■ ඔබ ලාභ නොලබන ආයතනයක් නම් (not for profit organization) ඔබගේ පිරිවැටුම (Turnover) වසරකට / 150,000 වඩා වැඩිනම්
■ ඔබගේ ව්‍යාපාරය / ව්‍යාපාරයේ කොටසක් වශයෙන් කුලීරථ සේවය (Taxi Travel) ලබාදෙයි නම්, ඔබගේ පිරිවැටුම නොසලකාහැර ඔබ ඩීඹ සඳහා වගකීමට බැදේ.

**7 හත්වන පියවර :** PAYG සඳහා ලියාපදිංචි වීම (Registration for Pay as You Go)

ඔබගේ ව්‍යාපාරයේ පාරිතෝෂික ලබන සේවයන්ගේ බදු රඳවාගැනීම සඳහා ඔබ PAYG ලියාපදිංචි විය යුතු වේ. ඊට අමතරව, ඔබගේ ව්‍යාපාරය අනෙකුත් (ABN) ව්‍යාපාරික අංකයක් සඳහන් නොකල ව්‍යාපාර සඳහා ගෙවයි නම් එවිටත් එම ව්‍යාපාර සඳහා බදු මුදලක් රඳවා තබාගැනීමට මෙම PAYG ලියාපදිංචිය වැදගත් වේ.

**8 අටවන පියවර :** ව්‍යාපාරික මූල්‍ය අවශ්‍යතාවන් තීරණය කිරීම හා ඒ සඳහා ඇති විකල්ප මාර්ග හඳුනාගැනීම

ඔබගේ ව්‍යාපාරයේ මූලික මූල්‍ය අවශ්‍යතාවයන් තීරණය කිරීම ඉතා වැදගත් වේ. ඉන් පසුව ඔබට එම මූල්‍ය අවශ්‍යතා සපුරාගත හැකි

38 වන පිටට

